**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2017**

------------------------------------------------------

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වගන්තිය හා 61 වගන්තිය යටතේ සාදන ලද 1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල් නියෝග මාලාවේ අංක 12 දරන නියෝගය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 45 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අයිතම වෙනම පෙන්නුම් කළ යුතු වුවත් මුළු බැරකම් වලින් සියයට 72 ක් නියෝජනය වන, චිත්‍රපට නිෂ්පාදනය වෙනුවෙන් චිත්‍රපට සංස්ථාවට ගෙවිය යුතු රු.1,457,772 ක් ශේෂ පත්‍රයේ වෙනම පෙන්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතයේ 9 වගන්තිය ප්‍රකාරව රු.10,633,747 ක් වටිනා මාස 3 ක් හෝ ඊට අඩු භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය යුතු වුවත් කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම් යටතේ ආයෝජන වැඩිවීම් ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,972,950 ක් වූ මෝටර් රථය සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම මෝටර් රථයෙහි රක්ෂණ ඔප්පුවෙහි සඳහන් වර්තමාන වෙළඳපොළ වටිනාකම රු.1,600,000 ක් ලෙස හඳුනාගෙන තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.2,000,000 ක්වූ ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා 2017 වර්ෂයට අදාළ පොළිය රු.44,848 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2001 හා 2002 වර්ෂයන්හිදී, මරදාන පිහිටි සිනේසිටි සිනමා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලදී ගැනීම සඳහා අරමුදල මගින් ලබාදී තිබුණු රු. 8,500,000 ක් වූ ණය මුදල සඳහා අයවිය යුතු පොළිය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. ණය මුදල සඳහා 2006 වර්ෂය දක්වා පමණක් අයවිය යුතු පොළිය රු.4,064,958 ක් ලෙස ගණනය කර තිබුණු නමුත් ඉන් අනතුරුව ලැබිය යුතු පොළිය ගණනය කිරීමක්ද කර නොතිබුණි.

**2.3. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මුදල් ආයෝජනය කිරිම සඳහා මුදල් ඇමතිවරයාගේ සහ අදාළ ඇමතිවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව රු.64,683,332 ක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 1999 ජුනි 17 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශයේ 6.5 වගන්තිය | ආයෝජන මණ්ඩල රෙගුලාසි යටතේ ඉදිකරන ලද සිනමා සංකීර්ණවල ප්‍රදර්ශනය කරනු ලබන එක් එක් ආනයනික චිත්‍රපටයක ප්‍රවේශ පත්‍රයකින් රු.2.25 හෝ මුළු ප්‍රවේශපත් ආදායමින් සියයට 2.25 ක් හෝ යන දෙකින් කවරක් හෝ වැඩි මුදල, ජාතික චිත්‍රපට සංස්ථාවේ ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලට ලැබිය යුතු වුවත් 2001 වර්ෂයේදී ඉදිකරන ලද මරදානේ පිහිටි සිනේ සිටි (Cine City) සිනමා සංකීර්ණයෙන් එලෙස අයවිය යුතු මුදල ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 1996 ඔක්තෝබර් මස 24 දින අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1996 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (විවිධ ගාස්තු) නියෝග අංක 4 වගන්තිය | සෑම සිනමා ශාලාවක් විසින්ම, ආනයනය කරනු ලැබූ චිත්‍රපටයක් ප්‍රදර්ශනය කරන අවස්ථාවක දී අයකරන ගාස්තුවලට (Leavy) අමතරව "යූ" ගණයේ චිත්‍රපටියක් සඳහා ප්‍රවේශ පත්‍රයකින් එක් රුපියලක් ද "එක්ස්" ගණයේ සහ "වැඩිහිටියන්ට වඩා සුදුසුයි" යන ගණවල චිත්‍රපට සඳහා ප්‍රවේශ පත්‍රයකින් රුපියල් තුනක්ද අය කළ යුතුය. එසේ අය කරන සම්පූර්ණ මුදල ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලට බැර කිරීම සඳහා සිනමා ශාලාවේ අයිතිකරු හෝ බදු ගැනුම්කරු විසින් සංස්ථාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු වුවත් එම මුදල් අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 | ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා |

| | |
|---|---|
| දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල් නියෝග අංක 6(ඇ) වගන්තිය | අයවිය යුතු අධිභාරයන් පාලක මණ්ඩලය විසින් නිශ්චය කර අයකරගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය දක්වා සිනමාශාලා හිමියන් වෙත ප්‍රදානය කර තිබූ රු.73,291,424 ක ණය මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,798,358 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,433,093 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,365,265 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අනෙකුත් ආදායම් රු.1,470,483 කින් වැඩිවීම එම වර්ධනයට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වර්ෂ 5 ත් වර්ෂ 24 ත් අතර කාල පරාසයක සිට පවත්නා රු.67,001,194 ක් වූ ණයගැති ශේෂ අයකර ගත නොහැකි ණය ලෙස හඳුනාගෙන තිබුණි. මෙම ණය මුදල් අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලෙහි ප්‍රධාන ආදායම් මාර්ගය වන චිත්‍රපට කුලී දායකත්වය ජාතික චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගත යුතු වුවත් වසර කිහිපයක සිට මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු මුදල රු.22,347,924 ක් විය.

(ඇ) 2001 හා 2002 වර්ෂයන්හිදී මරදාන සිනේසිටි සිනමා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලට ගැනීම සඳහා පෞද්ගලික සමාගමකට ලබා දී තිබූ රු.8,500,000 ක ණය මුදල, ගිවිසුමේ කොන්දේසිවලට වඩා වෙනස් ආකාරයේ අය කිරීම නිසා 2017 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් රු.2,212,910 ක් අයකරගත යුතුව පැවතුණි.

(ඈ) ඉහත (ඇ) ඡේදයේ සඳහන් ණය ගිවිසුමට අනුව, සිනේසිටි සිනමා සංකීර්ණයේ චිත්‍රපට ප්‍රදර්ශනයේදී ජාතික චිත්‍රපටි සංවර්ධන අරමුදලෙන් දුන් ණය අයකරගන්නා තෙක් වසර 15 ක පමණ කාලයක් සංස්ථාව විසින් සපයනු ලබන චිත්‍රපට ප්‍රදර්ශනයට ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කළ යුතු බව දක්වා තිබුණද අරමුදලේ කළමනාකරණය විසින් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර බිල්පත්වල හා ප්‍රති මිලදී ගැනීමේ භාණ්ඩාගාර බිල්පත් තැන්පතුවල (Repo) ආයෝජනයන් පිළිවෙලින් රු.52,080,342 ක් හා රු.10,602,990 ක් විය. මෙම ආයෝජනයන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුළ දිගින් දිගටම ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත් මේ සඳහා භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ කටයුතු සඳහා ප්‍රාථමික වෙළඳුන් වූ අනෙකුත් රාජ්‍ය බැංකුවල මිල ගණන් කැඳවා වඩා වාසිදායක පොලී අනුපාතයකට ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 විධිවිධාන ප්‍රකාරව අරමුදලේ ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | චිත්‍රපට කුලී ආදායම අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර නොතිබීම. |
| (ආ) | ණය පාලනය | ණය ලබා දීමේ හා අයකර ගැනීමේ රීති මාලාව යාවත්කාලීන කර නොතිබීම හා හිඟ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ආයෝජන | ආයෝජන පිළිබඳ නීති රීති සහ වඩා වාසිදායක ආයෝජන උපාය මාර්ග යනාදිය පිළිබඳ අවධානය යොමුකර නොතිබීම. |